# වදන් කවි පොත

පළමුව බුදුන් වැඳ
දෙවනුව දෙසූ දහම් වැඳ
මහසඟ රුවන් වැඳ
පටන් ගනිමුව ගණදෙවිඳු වැඳ

තුබූ තැනෙක සොර සතුරන් ගත නොහෙනා
එසැඩ මනාවත් වතුරෙන් වළ නොයනා
කෝප වුවත් රජ මැතිඳුන් ගත නොහෙනා
උගත මනා සිල්පය මැයි මතු රැකෙනා

අල්ලට සිඟාවත් රසනැති කැවිලි කකා
වල් කොළ බිම අතුට නිදි නොලැබ දුක් තකා
කල්ගිය රෙදි වැරැළි ඇඳ දලි කුණෙන් වකා
ඇල්මෙන් අකුරු උගනිවු ඉදිරි වැඩ තකා

වේවැල් කෝටු නාරං සියඹලා අතු
කිතුල් පොල් ඉරටු වැල් කසඹිලිය අතු
මෙහැම ඉපල් මගෙ දැතට නොපෑ යුතු
පමා නොවී එම් අකුරට මෙයින් මතු

# සුභාසිතය

පින්මද පුතුන් සියයක් ලදුවත් නිසරු
ගුණනැණ බෙලෙන් යුතු පුතු ම ය ඉතා ගරු
එක පුන් සඳින් දුරුවෙයි ලොවැ ගන අඳුරු
නෙක තරු රැසින් එලෙසට නොම වේ ය දුරු

පහනින් පහන් සිය ගණනක් ඇවුළුව ද
එපහන් සිළෙහි අලු අඩු නො ව දිලෙන ලෙද
ලොව අන් සතුන් ගුණ පළ කරමින් නිබඳ
සුපසන් ගුණෙන් වැජැඹෙති සුදනෝ පබඳ

පැනසර නොවන සත නිති සුදනන් පැහැර
කරදර දුදන සමඟ ව වෙසෙති හැම වර
මනහර ගජ කුඹින් මුතු දිමුතු මුතු හැර
උරසර සන වැන්න උණිදැට ගෙන සබර

# කාව්‍යශේඛරය

පියැලි බඳ   දහසින්
පාමුලැ තබා   සතොසින්
අදර බැති   වෙසෙසින්
එගුරු සරණත නැමැඳි   සිරසින්

එ දවස පටන්   කොට
ඔහු ගෙයි පළමු නැගි   සිට
මිසක් කී   තැනකට
නො යේ නොසිටී නොරිසි   ලෙසකට

අත් පා   මෙහෙවරින්
දවසැරැ ගුරුන්   හසරින්
දුන් උන්   අවසරින්
පසු වැ සැතැපේ ඇමට   අදරින්

ගුරු දරු නෑ   සියන්
යළි දු ඔහු   විස්වැසියන්
පළමු   අතැවැසියන්
හැඳිනැ අනදර නොකැරැ   කිසියන්

ගුරු සිත   නොරිදවා
වේලාව   නොවරදවා
බැති පෙම්   උපදවා
අකුරු උගනී කුමරු   සොඳවා

කෙළෙහි ගුණ දන්නා
කී දෙය යුහු වැ ගන්නා
නුවණැති වැ ඉන්නා
කුමරු ලත් දෙය ගුරුට පෙන්නා

කාවිසි සිතින් නිති
වැඩ කැමැති වැ වෙනස් නැති
ගුරු සිත් ලෙසැ පැවැති
කුමරු සව් සත ගෙවා දැනගති

පැහැයෙන් සුවදිනුදු
මොහොරත සපු කැකුළ බඳු
රුවින් ගුණ නැණිනුදු
වැඩිණි මහ සත් වෙමින් පරසිදු

සිවු වේ විදු දසට
සව් සිප් කලා සිවු සැට
සත් ආගම ඇමට
ඉතා නිපුණ යැ කුමරු කීමට

පෙණෙහෙල්ලෙන් ඇවුළු
පහනෙව් වතුන් අලු කළු
ගුරුනුදු නොමැ හසළු
කුමරු සත දැන යසින් සුලකුළු

# බුදුගුණාලංකාරය

රහසත් පව් නොකොට
කෙලෙසරයනුත් දුරු කොට
නිසි වූයෙන් පුදට
**අරහ** යයි නම් කියති මුනිදුට

තුන් කල්හි ම පැවැති
පදරුත් සියල් ලොව ඇති
අතැඹුල සෙ දැනගති
එයින් **සම්මාසම්බුදුන** යෙති

විද්දෑ නැණ අට ද
පසළොස් සරණ ගුණය ද
ඇතියෙන් එමුනි සඳ
පිරුණු **විජ්ජාචරණ** නම් ලද

යහපත් කොට යෙතැයි
සුන්දර තැන සැපතැයි
සොඳුරු බස් කියතැයි
කියති ඒ මුනිරජුට **සුගතැයි**

තුන් ලොව තතු ලෙසට
දැනගෙන නොදත් මෙලොවට
දෙසුයෙන් නියම කොට
**ලෝකවිදු** යයි කියති මුනිදුට

| | |
|---|---|
| හැම ගුණයෙන් | නද |
| සමවැඩි සතකු ඇම | ද |
| දියතෙහි නැති | සද |
| **අනුත්තර** යයි කියති | මුනිද |
| | |
| බඹ සුර යකුන් | තද |
| දමනය කර තමන් | ලද |
| සෙත් දී මුනිඳු | සඳ |
| **පුරිසදම්සාරථී** නම් | ලද |
| | |
| බව කතරින් | එතර |
| ලනුයෙන් සතන් | හැමවර |
| තිලෝගුරු | මුනිවර |
| වීය **සත්ථා** නමින් | පුවතර |
| | |
| සිව්සස් සිය | නුවණින් |
| දැන දැන්වීය | කුළුණින් |
| දුරලයි | අනුවණින් |
| එ **බුදු** නම් වී ය ගුණ | පමණින් |
| | |
| බෙදුයෙන් දහම් | කඳ |
| බජනය කළෙන් ගුණ | කඳ |
| බග දහමින් | සසඳ |
| බැවින් **බගවත්** වීය | මුනිසඳ |